# Professional Tutoring



English - Up to Year 9

Mathematics - All Year Levels

Maths Methods/General maths - Year 11

Maths Methods/ Specialist Maths/
Further Maths - Year 12

Selective School Exams

Scholarship Exams

Qualified Tutors
Over 17 Years experience in Australia
Produced excellent results
Individual or Small group classes

Contact
03 9470 8295
0409 854 597
email - hemantha2020@yahoo.com.au
induminik@yahoo.com.au

**හේමන්ත දේවේන්ද්‍ර**
**නෙරංජනා කුඩලිගම**
Home Visits possible


# සිනුවර හසුන

## සිඩ්නි සිට ලියමි



පසුගිය දිනක මෙල්බර්න් පුරවර හෙවත් "මෙපුරේ" දී පැවැත්වුන ජගත් ජේ. එදිරිසිංහ ගේ "රාජාලි පියාපත", "තාරකා විජිතය" සහ "ඉස්කෝලෙ කාලේ" පොත් ත්‍රිත්වය සහ "හුදකලා මිනිසා" සංඝත තැටිය දෙරට වැඩීමේ උළෙලට සහභාගී වීමට මට ද වරම් ලැබුණි.

එහිදී කෙටියෙන් කතාවක් කළ මෙපුර වසන මහා ලේඛක බෝල්ඩ්වින් කුරුප්පු හෙවත් ඩී.බී., සිනුවර හෙවත් සිඩ්නි නුවර වෙසෙමින් "සිනුවර හසුන" ලියන සිනුවර ආරච්චිල ගේ සිත කුල්මත් කරවූ කරුණු කිහිපයක් පැවසුවේය.
ඉන් එක් කරුණක් නම්, සිනුවරට වඩා වැඩි සිංහල ජනකොටසක් මෙපුර විසූවද, සිංහල ලේඛකයින් බහුතරය වෙසෙන්නේ "මෙපුර" නොව "සිනුවර" බවයි.
සිනුවර හසුන ලිපි මාලාව ආරම්භයේ දී ම ඕස්ට්‍රේලියානු සිංහල සංස්කෘතියේ තෝතැන්න "මෙපුර" බව මම සඳහන් කළෙමි. ඒ ජන පිරිස ගණනෙන් වැඩි නිසාය. සිංහල සිනමා සිත්තමක එක් දර්ශණයක් පැවැත්වීමට සිනුවර දී හාරසිය දෙනෙක් හොයා ගැනීමට අපහසු වූවද, "මෙපුර" දී නම්, දර්ශන වාර එක් දිනක දෙකක් පමණද, උතුරු සහ දකුණු තදසන්න ප්‍රදේශවල වෙන වෙනමද වශයෙන් පැවැත්වේ. ඒ එක් උදහරණයක් පමණි.

තත්වය එසේ වූ කල, ලේඛක පරපුර අතින් සලකා බලන කළ සිනුවර අප ඉදිරියෙන් සිටින බව දැන ගැනීම අතිශය ප්‍රීති ජනක කාරණයකි.

අද සිනුවර හසුනෙන් මා අදහස් කරන්නේ, එද ඩී.බී. ගේ ප්‍රකාශයට මුල් වූ සිනුවර වසන සිංහල ලේඛකයින් කවුදැයි ඔබට හඳුන්වා දීමයි.

සමන් මහානාම දිසානායක ඉන් ප්‍රමුඛයාය. ඔහු මේ වන විට "බඹරුන්දේ කඟවේනා", "කැන්ගරු නිම්නය", "පුංචි සර්", "රන්දෙනිගල වලව්ව", "දුරුතු සිහිනය" සහ "ලන්සි කෙල්ල" නමින් නවකතා හයක් ප්‍රකාශයට පත්කර ඇත. පොත් වශයෙන් ඉදිරියේ දී එළි දැක්වීමට නියමිත තවත් නවකතා කිහිපයක් ද, කෙටිකතා රාශියක් ද ඔහු විසින් ලියා ඇත. මේ නිර්මාණ සියල්ලම සමන් අතින් නිමවුනේ මේ සිනුවරදීම වීම ද විශේෂයකි.

එස්.බී.එස්. ගුවන් විදුලියේ සිංහල වැඩ සටහන් අධ්‍යක්‍ෂකවරයා වන පාලිත ගනේවත්ත සිනුවර වෙසෙන කෘතහස්ත ලේඛකයෙකි. "ඇවිත් නොරටක" නමින් නවකතාවක් ලියා පල කළ පාලිත "බොඳවූ ලොව" සහ "ඇසි"පිය" නමින් කාව්‍ය සංග්‍රහ දෙකක් ද, "ලේ හුරු සුවඳ" නමින් කෙටිකතා එකතුවක්ද, ඇන්ටන් චෙකෝෆ් ගේ කෙටිකතා එකතුවක සිංහල පරිවර්තනයක් ද මේ වන විට පළ කර ඇත. පාලිත ගනේවත්ත "මෙපුර" පලවෙන සන්නස සහ පහන පුවත් සඟරාවලට නිරතුරු ලිපි සපයන්නෙකි.

ගවේෂණාත්මක පුවත්පත් කලාවේදියෙක් ලෙස ශ්‍රී ලංකාවේ දී නමක් දිනු අනුර හොරේෂස් අද සිනුවර වෙසෙන ලේඛකයින් අතර දැවැන්තයෙකි. ඔහු සිය "ගිනි අවි සහ ගිනි කෙලි" පොත් මාලාවේ කොටස් හතරක් ශ්‍රී ලංකාවේ දී ලියා පලකර ඇත. මින් ග්‍රන්ථ දෙකක් ම සිනමා සිත්තම් ලෙසින් ද අප අතරට පැමිණ ඇත. පසුගිය දිනවල අනුර ගේ කතෘත්වයෙන් "රසකතා" නම් සඟරා පිංචක් ද සිනුවර දී ප්‍රකාශයට පත්වුනි.

සන්නස සහ පහන සඟරාවලට ඔහු ලියූ විචාරාත්මක තීරු ලිපිවලින් අප හඳුණන ලක්ෂ්මන් කොඩිතුවක්කු "පැය අටේ මිත්‍රයෝ" නමින් කාව්‍ය සංග්‍රහයක් එළි දක්වා ඇති අතර මේ වසරේ දී ඔහු "පුංචි ටොමිය සිඩ්නි ගියා" නමින් ළමා කතාවක් ද, "පරමේෂ්වරී ගේ කතාව" නමින් කෙටිකතා එකතුවක් ද පළ කර ඇත. ලක්ෂ්මන් ගේ මේ පොත් දෙරට වැඩුම ජුනි මස 12 ද සිනුවර දී පැවැත්වේ. මීට අමතරව ලක්ෂ්මන් සිනුවර දී විවිධ අවස්ථාවල රඟ දැක්වුණු කෙටි වේදිකා නාට්‍ය සහ ළමා නාට්‍ය ගණනාවක් සහ විවිධ ගායකයින් ගේ සංඝත තැටිවලට අඩංගු වුණු ගීත ගණනාවකම පද රචනය ද කර තිබේ.

එස් පියසේන නම් වූ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියා ද සිනුවර තම වත්මන් වාසභූමිය කරගත්තෙකි. "රටවල් තුනක මාධ්‍ය සමග දශක තුනක්" සහ "කලු ජූලියේ රිදී ජුබිලිය" නම් කෘති ලියා පල කර ඇති ඔහු, පහන සහ සන්නස පුවත් සඟරාවලට ද, ශ්‍රී ලංකාවේ ඉරිද පුවත්පත්වලට ද නිරතුරු දේශපාලන විචාර ලිපි සපයයි.

උපාලි විමලවීර සිනුවර වෙසෙන ජ්‍යෙෂ්ඨ කවියෙකි. ඔහු ලියූ ශ්‍රී ලංකාවේ දී ලියා පළ කළ කවි පොත් අතර "වැදිලිය", "සාම හස්ති සංදේශය", "බල බලු පොරය", "සිංහරාජ සංදේශය", "ගව සංදේශය" යනාදී ග්‍රන්ථ දහයක් වේ. ලංකාවේ යුද්ධය අළලා උපාලි ලියූ නවතම කාව්‍ය ග්‍රන්ථය ද නොබෝද සිනුවර දී මුද්‍රණද්වාරයෙන් බිහිවුණි.

සිනුවර වෙසෙන තම සිංහල ගද්‍ය, පද්‍ය නිර්මාණ පොත් වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති අනෙකුත් ලේඛකයින් අතර, "සමනල දූතය" කාව්‍ය සංග්‍රහය සහ "ගම් සරණිය" නවකතාව ලියූ හෙන්රි කුමාරප්පෙරුම, "පිය සෙනෙහස" සහ "අතීත සෙවනැලි" කාව්‍ය සංග්‍රහ ලියා පල කළ ඇනට් ගුණසේකර, "සිව් සිත් කවි" කාව්‍ය සංග්‍රහය ලියා පල කළ රසික සූරියආරච්චි, "ගැහැණිය" කාව්‍ය සහ චිත්‍ර සංඝත නිර්මාණ සංග්‍රහය කළ චන්ද්‍රා මල්ලවආරච්චි ද වේ.
ඉහත ප්‍රකාශනවලට අමතරව, පංච තන්ත්‍රය ආශ්‍රයෙන් හෙන්රි ලියූ "වණ රජ දහන" නම් වූ කාව්‍ය ග්‍රන්ථය කොටස් දෙකකින් යුක්තව ඉදිරියේ දී ප්‍රකාශයට පත්වීමට නියමිතය. රසික සූරියආරච්චි තමා ලියූ සිංහල ගීත කාව්‍ය අඩංගු වෙබ් අඩවියක් "පෙම් ගී" නමින් නිර්මාණය කොට ඇති අතර, "කතන්දර" නමින් සිංහල බ්ලොග් අඩවියක් පවත්වාගෙන යයි.
මේ හැරුණු විට පොත් වශයෙන් එළි දක්වා නැති වූවද, විවිධ නිර්මාණ සහ ලේඛන වාර සඟරා මගින් ප්‍රකාශයට පත්කර ඇති ලේඛකයෝ ද සිනුවර වෙසෙති.

මේ කරුණු අපටත් වඩා හොඳින් "මෙපුර" ලේඛක ඩී.බී. කුරුප්පු දැන සිටීම මා පෙරකී පරිදි අප හැමගේ සතුටට කාරණයකි.

එහිදී වැඩි දුරටත් කතා කළ ඩී.බී., සිංහල සාහිත්‍යය විශ්ව තලයට නංවන්නට සමත් ලේඛකයින් කිහිප දෙනෙක්වත් මේ ඕස්ට්‍රේලියාව තුල සිටී යැයි ද පවසා සිටියේය. "මෙපුර" සිට සාහිත්‍ය කටයුතුවල ද, සාහිත්‍ය සේවා වලද නිරතවන අප හිතවත් ජගත් ජේ. එදිරිසිංහ ඉන් එක් අයෙකු ලෙස ඩී.බී ගේ මුවින් නියත විවරණ ලැබීම, අප පෙර කී සතුට පරදවාලීය.

ලබන මාසයේ නැවත හමුවෙමු.

**සිනුවර ආරච්චිල** <sinuwara.arachchila@gmail.com>


GATEWAY
LAWYERS

- Advice on Legal Matters
- Business & Commercial Law
- Sale of Business
- Conveyancing
- Powers of Attorney
- Wills & Estate Planning
- Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia